# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2016 (පැරණි නිර්දේශය)

2022 මාර්තු/අප්‍රේල්

සමාජීයවිද්‍යා පීඨය

**සංවර්ධන අධ්‍යයනය - DVST E 1025**

## ග්‍රාමීය සහ ප්‍රාදේශීය සංවර්ධනය

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.

කාලය : පැය 03 යි.

---

1. සංවර්ධනයේ ප්‍රාදේශීය වෙනස්කම් අධ්‍යයනය කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරන්න. (ලකුණු 20)

2. සංවර්ධනය වන රටවල ග්‍රාමීය සංවර්ධන ගැටලු වල පොදු ලක්ෂණ උදාහරණ ඇසුරින් ගෙනහැර දක්වන්න. (ලකුණු 20)

3. කිසියම් රටක ප්‍රාදේශීය සංවර්ධන අසමානතා නිර්මාණය වන පසුබිම් සාධක 4 ක් පැහැදිලි කරන්න. (ලකුණු 20)

4. සංවර්ධන ක්‍රියාවලියේදී ග්‍රාමීය සහ නාගරික වශයෙන් සංවර්ධන පරතරය පුළුල් වීමට බලපාන සාධක 05 ක් විස්තර කරන්න. (ලකුණු 20)

5. ග්‍රාමීය ප්‍රදේශ ක්‍රමයෙන් නාගරික ප්‍රදේශ බවට පත් කරන ක්‍රියාවලිය උචිත න්‍යායාත්මක ආකෘතියක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 20)

6. ගෝලීය සංවර්ධනය ක්‍රියාවලියේදී සිදුවන වෙනස්කම් වලට සංවර්ධනය වන රටවල ග්‍රාමීය සංවර්ධනය ක්‍රමයෙන් හැඩගැසෙන ආකාරය උචිත උදාහරණ මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 20)

7. අධ්‍යාපනය සහ තාක්ෂණය පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ වල සංවර්ධන වෙනස්කම් මඟහැරවීම සඳහා යොදා ගත හැකි ආකාරය විමර්ශනය කරන්න. (ලකුණු 20)

8. පසුගිය අඩසියවසක කාලය තුල ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රතිඵල සුදුසු උදාහරණ ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 20)